මගේ අංක:-PPSC/ES/14/FI/01/34
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
නවනගරය,රත්නපුර
2024.06. 24

| |
|---|
| සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා<br>චක්‍රලේඛ ලිපි අංක **17 /2024** |

01.ප්‍රධාන ලේකම්,ප්‍රධාන ලේකම් කාර්යාලය
02.ආණ්ඩුකාර ලේකම්,ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,ස.ප.ස
03.සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය,ස.ප.ස
04.සියලුම ලේකම්වරු,ස.ප.ස

**සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස ළමාරක්ෂක හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MN 4-2016) සඳහා ස්ථානභාර නිලධාරි (Officer in-charge) තනතුරු සඳහා සීමිත පදනමින් බඳවා ගැනීම-2024**

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස ළමාරක්ෂක හා සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MN 4-2016) ස්ථානභාර නිලධාරි තනතුර සඳහා ප්‍රධාන ලේකම්ගේ අංක DCSPT/12/P1/01 හා 2024.01.02 , 2024.01.10 දිනැති ලිපි මගින් ලබා දී ඇති නිර්දේශය පරිදි, සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද බව සඳහන් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GS/ES/6/8/3 හා 2024.03.06 දිනැති ලිපිය පරිදි, **මෙවරට පමණක් විශේෂ වන සේ බඳවා ගැනීම් පරිපාටියේ අනෙකුත් සුදුසුකම් හා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය අනුගමනය කරමින්**,සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ දැනට සක්‍රීය සේවය කරන පහත සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් **සීමිත පදනම** මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.මේ සම්බන්ධයෙන් ඔබගේ හා ඔබ යටතේ සියලු දෙපාර්තමේන්තු/ ආයතනවල නිලධාරීන්ගේ දැනගැනීම සඳහා යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. **මෙම චක්‍රලේඛය හා අයදුම්පත්‍රය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ** www.psc.sg.gov.lk **හා සබරගමුව පළාත් වෙබ් අඩවියට** www.sg.gov.lk යොමු කර ඇත.

**01. පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව :- 02**
**02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2024.07.25**

**03. බඳවා ගැනීමේ සුදුසුකම් :-**
**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් සමාජ විද්‍යාව,මානව විද්‍යාව,මනෝ විද්‍යාව,යන විෂයන්ගෙන් එක් විෂයක් සහිතව උපාධියක් ලබා තිබීම හෝ සමාජ වැඩ පිළිබඳ උපාධියක් ලබා තිබීම.**

**04. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.**
**05. මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය:-**
අංක 3/2016 හා 2016.02.25 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වැටුප් කාණ්ඩය MN – 04-2016 වන අතර වැටුප් පරිමාණය රු:31,490-10X445-11X660-10X730-5X750-රු 54,250/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

**06. පොදු සුදුසුකම්**

(I) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු යි.

(II) **2024.07.25** දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු වන අතර අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුනක් තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචිය නොමැති නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(III) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.සෑම අපේක්ෂකයකුම සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා කායික මානසික හා අන් සෑම අයුරකින්ම යෝග්‍ය විය යුතු ය.

(IV) බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්,එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

07.මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

08. බඳවා ගැනීමේ ක්‍රමය:-

ව්‍යුහගත පරීක්ෂණයක් මගින්,ලකුණු ලබා දීමේ ක්‍රමයක් අනුගමනය කරමින් ලකුණුවල ප්‍රමුඛතාවය මත ඉහළම කුසලතා දක්වන අයදුම්කරුවන් කුසලතා අනුපිළිවෙළ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන ප්‍රමාණයක් බඳවා ගනු ලැබේ.

09.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ පිළිබඳ විස්තර:-

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන විෂය ක්ෂේත්‍රය | කාණ්ඩ ලකුණු ප්‍රමාණය | මුළු ලකුණු | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.අතිරේක අධ්‍යාපන සුදුසුකම් | | 40 | 40%<br>ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ. |
| i. පූර්ව ළමාවිය/ළමා සංවර්ධන වැනි අංශ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා සහතිකය (තෘතියික හා වෘත්තිය කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් ලබාගත්) | 05 | | |
| ii. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය/ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් ලබා ඇති සමාජ වැඩ පිළිබඳ දෙවාර්ෂික ඩිප්ලෝමාව | 10 | | |
| iii. පශ්චාත් උපාධිය (සමාජ විද්‍යාව/මනෝ විද්‍යාව/සමාජ වැඩ/මානව විද්‍යාව/අපරාධ විද්‍යාව/සාමය හා ගැටුම් කළමනාකරණය/උපදේශනය) | 15 | | |
| iv. අයදුම්කරුගේ ආගමට අදාළ දහම් පාසල් අවසාන සහතිකය | 10 | | |
| 2.අතිරේක වෘත්තිය සුදුසුකම්<br>i. රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක ළමා සංවර්ධන පෝෂණය,ප්‍රථමාධාර වැනි ළමුන්ට අදාළ ක්ෂේත්‍රයක මාස 06 ට නොඅඩුව ලබා ඇති ප්‍රවීණතාව | 10 | 10 | |
| 3.විෂය බාහිර ක්‍රියාකාරකම්<br>ක්‍රීඩා/නායකත්ව/සමාජ සුභසාධන කටයුතු/කලා කටයුතු ආදී | 30 | 30 | |
| 4.සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය | 20 | 20 | |
| මුළු ලකුණු ප්‍රමාණය | | 100 | |

මෙම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පවත්වනු ලැබේ.ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

**10.අයදුම්කිරීමේ ක්‍රමය**

10.1. මෙම නිවේදනය අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.මෙම බඳවා ගැනීම් නිවේදනයට අදාළව සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් තම පෞද්ගලික ලිපිගොනුව නඩත්තු කරන ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් යොමු කළ යුතු වේ.

10.2.විභාග ගාස්තුව රු. **600/-** කි. **මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99** දරන **ආදායම් ශීර්ෂයට බැරවන ලෙස** සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

10.3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2024.07.25** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස ළමාරක්ෂක හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MN4-2016) සඳහා ස්ථානභාර නිලධාරි (Officer in-charge) තනතුරු සඳහා වන සීමිත බඳවා ගැනීම-2024"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාල සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4.අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේතොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනිමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනිම මෙම කොමිෂන් සභාව සතුවේ.

ආර්.කේ.ඒ සුජීතා
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

# ආදර්ශ අයදුම්පත්‍රය

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයෙහි පරිවාස ළමාරක්ෂක හා සේවා දෙපාර්තමේන්තුවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණය (MN 4 - 2016) සඳහා ස්ථානභාර නිලධාරි (Officer in-charge) තනතුරු සඳහා වන සීමිත බඳවා ගැනීම-2024

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

01. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-..........................................................
..........................................................................................
..........................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-..........................................................................
..........................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-.........................................................................
..........................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:- | | | | | | | | | | | | |

ඉ. දුරකථන අංකය:- ජංගම-................................. ස්ථාවර-.........................................
ඊ. විද්‍යුත් තැපැල:- ....................................

02. I. දැනට සේවය කරන ආයතනය :-...................................................................
......................................................................

II දැනට සේවය කරන ආයතනයේ ලිපිනය:.........................................................
......................................................................

(විභාග ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට එවනු ලැබේ)

III. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර ☐ කෑගල්ල ☐

IV. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන **2024.07.25** දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව
අවුරුදු ☐ මාස ☐ දින ☐

ඔබ සබරගමුව පළාතේ පදිංචි කරුවකු නොවේ නම් කලත්‍රයා සබරගමුව පළාතේ පදිංචි අයකුදැයි සඳහන් කරන්න..............................................................................

03. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ☐
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාල අංකය කොටුව තුල ලියන්න.)

II. උපන්දිනය :- වර්ෂය ☐ මාසය ☐ දිනය ☐

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2024.07.25** දිනට වයස :-
අවුරුදු ☐ මාස ☐ දින ☐

04. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධි පිළිබඳ විස්තර

| විශ්ව විද්‍යාලය | හදාරා ඇති උපාධිය | කාලසීමාව | සාමාර්ථය | වලංගු දිනය (Effective date) |
|---|---|---|---|---|
| | | | | |

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.උපාධි සහතිකයේ හෝ උපාධිය සමත් බවට විශ්ව විද්‍යාලයෙන් ලබා දෙන සනාථන ලිපියේ ඡායා පිටපතක් ද අමුණන්න)

අනෙකුත් සුදුසුකම් කෙටියෙන් (බඳවා ගැනීම් නිවේදනයට අදාළව):
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :- ......................................
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-...................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය

.......................................................වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නෙසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- ...........................

.......................................
අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

.............................................................. මයා/මිය/මෙනවිය දැනට සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ................................................................ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................................. වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්,ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :- ...................

.............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව තබන්න)